# UNHRC යෝජනාව පිළිබඳ CPA ප්‍රකාශය

2015 ඔක්තෝබර් 1

ජිනීවාහි පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ 30 වන සැසි වාරයේ දී 'ශ්‍රී ලංකාව තුළ ප්‍රතිසන්ධානය, වග වීම හා මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම' නමැති යෝජනාව සම්මත කරනු ලැබීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ (CPA) ප්‍රශංසාවට ලක් වේ. අතීත ස්ථාවරයන්හි අතිමූලික වෙනසක් ඇති කර ගත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව මැසිඩෝනියාව, මොන්ටිනීග්‍රෝ, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ජපානය, සියෙරා ලියොන්, ඇල්බේනියාව, නෝර්වේ, ස්විට්සර්ලන්තය සහ තවත් රටවල් කිහිපයක් සමග එක්ව යෝජනාවට සම අනුග්‍රහය දැක්වූයේ ය. මෙය වනාහි අතීත ප්‍රචණ්ඩත්වය හා පද්ධතිමය අසමර්ථතා පිළිගැනීම සම්බන්ධයෙන් කලින් ගෙන තිබූ ස්ථාවරය සැලකිය යුතු ලෙස වෙනස් වී තිබෙන බව ද සත්‍යය සොයා ගැනීම, යුක්තිය ඉටු කිරීම, වන්දි ගෙවීම හා මෙවැන්නක් නැවත සිදු නොවන බව සහතික කිරීම ගැන අවධානය යොමු කරන විශ්වසනීය මුල පිරීම් අවශ්‍ය බව ද පෙන්නුම් කරන්නකි. මෙම නිර්භය පියවර ගැන සතුට පළ කරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආණ්ඩුවේ කැප වීම ක්‍රියාවට නැංවීමේ අභියෝගාත්මක කටයුත්ත තිබෙන්නේ ඉදිරියේ බවත් වගවීම හා ප්‍රතිසන්ධානය උදෙසා දේශපාලන අධිෂ්ඨානයක් පැවතිය යුතු බවත් සඳහන් කර සිටී.

මෙම යෝජනාව වූ කලී 2015 දී ඉතිහාසගත මැතිවරණ දෙකකින් වරම් ලැබ නව ශ්‍රී ලංකාවක් කරා සිදු වන සංක්‍රමණයක එක් ප්‍රධාන පියවරක් සංඥා කරන්නකි. වර්තමාන යෝජනාව ජාත්‍යන්තර ක්‍රියාකාරකයන්ගේ ඵලදායක සහභාගිත්වය සහිත අධිකරණමය හා අධිකරණමය නොවන නැවුම් ක්‍රමෝපායන්ගෙන් සමන්විත පුළුල් සංක්‍රාන්තික යුක්තිය පසිඳලීමේ ප්‍රතිපත්තියකට හා පැකේජයකට මුල පිරීම සඳහා ආණ්ඩුවට රාමුවක් සපයන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහස යි. විශේෂ අධිකරණයක් හා සත්‍යය සෙවීමේ කොමිසමක් ඇතුළු ආයතන කිහිපයක් පිහිටුවන ලෙසත් ශ්‍රී ලංකාව තුළ අතුරුදන් වීම් සම්බන්ධයෙන් ලැබී තිබෙන පැමිණිලි තොගය විභාග කිරීමට පියවර ගන්නා ලෙසත් යම් යම් නීතිමය ප්‍රතිසංස්කරණ සිදු කරන ලෙසත් යෝජනාව ඉල්ලා සිටී. යෝජනාව දේශපාලන විසඳුමක් හා දේශපාලන බලය පැවරීම ඇතුළු වෙනත් කැප වීම් කිහිපයක් ගැන ද සඳහන් කරයි. මේ හැරුණු විට එය සංක්‍රාන්තික යුක්තිය පසිඳලීමේ ක්‍රමෝපායක් ඇති කිරීම සහ ශ්‍රී ලංකාවේ සියලු ජනතාවන් අතර විශ්වාසය ගොඩ නැගීම උදෙසා — ආරක්ෂක අංශයට අදාළව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, නීත්‍යානුකූල සිවිල් හිමිකරුවන්ට ම ඉඩම් ආපසු ලබා දීමේ කාර්යය වේගවත් කිරීම හා ප්‍රහාර ගණනාවක් සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණ පැවැත්වීම ඇතුළු — සැලකිය යුතු පියවරයන් කිහිපයක් ගැනීම සඳහා ආණ්ඩුව දිරි ගැන්වීම ද කරයි.

ඉටු කරන බවට ප්‍රතිඥා දී තිබෙන ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ හා සංක්‍රාන්තික යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලි ඔස්සේ නව ශ්‍රී ලංකාවක් නිර්මාණය විය හැකි බැවින් ආණ්ඩුව මෑත කළ කැප වීම් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට යන වඩා විසල් ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයකට සම්බන්ධ බව කිව හැකි ය. ප්‍රතිසංස්කරණ සිදු කරමින් පෙරට යන අතරතුර මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය (OHCHR) ශ්‍රී ලංකාව පිළිබඳව කළ පරීක්ෂණයේ (OISL) වාර්තාව තුළ අන්තර්ගත වන සොයා ගැනීම් ගැන සිතා බැලීම ද තීරණාත්මක වේ. ජාත්‍යන්තර අපරාධවලට සමාන භයංකර උල්ලංඝනයන් එහි ලේඛනගතව ඇත. එම වාර්තාව වග වීමේ පියවරයන් හා ආරක්ෂාව පිළිබඳ ගැටලු හා සම්බන්ධ අතීත අසමර්ථතා හා ව්‍යූහාත්මක දෝෂ ගැන ද සඳහන් කරයි. මෙම අතීතය සමග ගනුදෙනු කිරීමේ දී දෙමුහුන් අධිකරණයක් පිහිටුවීම, සාක්ෂිකරුවන් හා ගොදුරු වූවන් ඵලදායක ලෙස ආරක්ෂා කිරීම හා ගොදුරු වූවන්ගෙන් හා වෙනත් පාර්ශ්වකරුවන්ගෙන් අව්‍යාජ ලෙස අදහස් විමසීම සඳහා කෙරෙන

ඉල්ලීම ද ඇතුළු OISL වාර්තාවේ ඇතුළත් සොයා ගැනීම් හා නිර්දේශ යළි සලකා බැලීමට සිදු වනු ඇත.

එළඹෙන සති හා මාසවල දී OISL වාර්තාවේ අන්තර්ගත සොයා ගැනීම් ද යෝජනාව ද ආණ්ඩුව කළ යුතු කැප වීම් ද ගැන පළි ගැනීම පිළිබඳ බියකින් තොරව සාකච්ඡා කිරීමට හා විවාදයේ යෙදීමට හැකි අවකාශයක් පැවතිය යුතු ය. මෙය සියල්ලන් විසින් සාමූහිකව තමන්ගේ ම සිතිවිලි හා හැඟීම් විමසීමට ලක් කළ යුතු කාලයක් ද වන අතර එමගින් සාමය හා ප්‍රතිසන්ධානය මුදුන් පමුණුවා ගැනීම සඳහා වන මෙම අසමසම අවස්ථාවේ පූර්ණ හැකියාව සාක්ෂාත් කර ගැනීමට පිළිවන් විය හැකි ය. යෝජනාව ශ්‍රී ලංකාව තුළ අඳුරු යුගයක අවසානය සනිටුහන් කරති යි බලාපොරොත්තු තැබිය හැකි ය. තමන් දුන් පොරොන්දු ඉටු කිරීම සඳහා පවතින අධිෂ්ඨානය හා කැප වීම ප්‍රදර්ශනය කිරීමට ආණ්ඩුව වහ වහා ද තීරණාත්මක ලෙස ද ක්‍රියා කළ යුතු ය. 2015 පැවති මැතිවරණ දෙකේ දී අප රටේ ගමන් මග ප්‍රජාතන්ත්‍රවාදී වෙනසකට ලක් කිරීමට වරම් දෙන ලද්දේ සියලු ශ්‍රී ලාංකික ජනතාවන්ගේ ප්‍රබල දේශපාලනික සහභාගිත්වය විසින් බව යළි සිහිපත් කරමින් පුරවැසියන් ලෙස අප මෙම ඓතිහාසික මොහොත ඩැහැ ගෙන අපගේ අනාගතය හැඩ ගැස්වීමෙහි ලා අඛණ්ඩව ද සක්‍රියව ද සහභාගි විය යුතු ය.

යෝජනාවට විරුද්ධ වන අය විශේෂයෙන් ගත් කල හා ලෝකය සමග අප සබඳතා ඇති කර ගන්නා වඩා ඵලදායක වූ නව ක්‍රමය පොදුවේ ගත් කල රාජ්‍යයේ ස්වෛරී භාවය අහිමි වීමක් ගැන කෙරෙන අතිශයෝක්ති සහගත වූත් නොමග යැවෙනසුලු වූත් තර්ක මත රඳා පවතින බව පැහැදිලි ය. ස්වෛරී භාවය පිළිබඳ මෙම සංකල්පවල යල් පැන ගිය බව හා සමකාලීන ජාත්‍යන්තර පටිපාටිය හැරුණු විට මේ අයට කලින් පැවති පාලන තන්ත්‍රයේ ආක්‍රමණශීලී හා සහයෝගී බවින් තොර විදේශ ප්‍රතිපත්තිය ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාව ගැන සුපරීක්ෂාකාරී වීම වඩා යහපත් අතකට හැරවූවා නො ව වැඩි කළ බව ද අමතක විය. වඩාත් ම වැදගත් කරුණ නම් ශ්‍රී ලංකාවේ සියලු ජනතාවන් — අප රට උදෙසා ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය, බහුත්වවාදය, සත්‍යය, යුක්තිය හා ප්‍රතිසන්ධානය පදනම් කර ගත් නව හා එක්සත් අනාගතයක් නිර්මාණය කිරීම සඳහා එකට එක් වෙමින් — යෝජනාව තුළ අන්තර්ගත වන ඒවා ද ඇතුළු වර්තමාන ප්‍රතිසංස්කරණ පියවරයන්ට වරක් නො ව දෙවරක් ම ප්‍රජාතන්ත්‍රවාදීව වරම් ලබා දුන්නේ ය යන්න ඔවුන් විසින් නො තකා හැරෙන බව පෙනෙන්නට තිබීම යි. ප්‍රජාතන්ත්‍රවාදී රටකට සිය අපේක්ෂා අනුව සිය අනාගතය තීරණය කර ගත හැකි බව අදහස් නො කෙරේ නම් ස්වෛරී භාවය යන්නෙන් අදහස් කෙරෙන දෙයක් නැත. මෙම අතිමූලික ප්‍රතිසංස්කරණයන් අධිෂ්ඨාන සහගතව මුදුන් පමුණුවා ගැනීම හා අතීතය සමග අර්ථාන්විතව ගනුදෙනු කිරීම තීරණාත්මක ලෙස වැදගත් වන්නේ අතීතයේ හට ගත් ප්‍රචණ්ඩත්වයට හා ආන්තික බෙදීම්වලට විසඳුම් සෙවීම හා ඒවා පරාජය කිරීම මග නොහැරිය හැකි අවශ්‍යතාවක් බැවිනි. අපට සැම සාර්ථක බහුත්වවාදී ප්‍රජාතන්ත්‍රවාදයක ම හරය වන නිදහස හා ඉවසා දැරීම පදනම් කර ගත් අතිමූලික දේශපාලන සම්මුතිවාදී මූලධර්ම තහවුරු කළ හැකි වන්නේ එවිට පමණකි.